*සැ. යු.* - 2024.09.13 දින පළ කරන ලද අංක 2402 ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,403 - 2024 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2024.09.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 364 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 368 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ඔක්තෝබර් මස 11 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජීවනී ගංගා රුවන්පතිරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.06.23 දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/24 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අම්බල, මිරිස්වත්තේ පදිංචි සයිනේරිස් ප්‍රන්සිස්කු වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 24 යටතේ 1982.09.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.18** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුවේ, අම්බල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අම්බල, මිරිස්වත්ත නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 300 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 397 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 යි පර්චස් 02 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මිරිස්වත්ත

| | |
|---|---|
| *උතුරට* | : ලොට් 366 දරන ඉඩම් කැබැල්ල, |
| *නැගෙනහිරට* | : ලොට් 406 දරන ඉඩම් කැබැල්ල, |
| *දකුණට* | : ලොට් 380 දරන ප්‍රවේශ පාර ද, |
| *බස්නාහිරට* | : ලොට් 396 දරන ඉඩම් කැබැල්ල |

ජේ. ගංගා රුවන්පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
බෙලිඅත්ත.

2024 ජූනි මස 20 වැනි දින.

09-138

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් නිරෝෂා සජීවනී ගමගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් වර්ෂ එක් දහස් නවසිය අසූ දෙකේ මැයි මස විසි වන දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/3288 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තලහගම පදිංචි එගොඩබැද්දෙ ගම්ආචාරිගේ හින්නි අප්පු වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 2348 යටතේ 1982.07.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.18** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරලය, උතුර තලහගම, නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තලහගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ අ.ග.පි. 86 හි කැබලි අංක 352ක් වූ ප්‍රමාණයෙන් අක්කර : 01 පර්:04 ක් ඇතැයි ගණන් බලා තිබෙන ගන්ගොඩකන්දෙ හේන්යාය *නොහොත්* තලහගම මූකලාන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :-

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. පි. 86 හි අංක 62 කේ 25 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 86 හි අංක 353 කැබැල්ල, |
| *දකුණට* | : අ. ග. පි. 86 හි අංක 355 1/2 කැබැල්ල, |
| *බස්නාහිරට* | : අ. ග. පි. 86 හි 200 කැබැල්ල |

නිරෝෂා එස්. ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2024 පෙබරවාරි මස 13 වැනි දින.

09-139/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් නිරෝෂා සජීවනී ගමගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් වර්ෂ එක් දහස් නවසිය අසූ අටේ පෙබරවාරි මස දහ වන දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/11805 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තලහගම පදිංචි පනාකඩුවගේ ජේන්නෝනා වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 940 යටතේ 1994 ජුනි 15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/අනුප්‍රාප්තිකයෙකුවීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.18** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරලයේ, උතුර තලහගම, නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය ලෙස සඳහන් වුවද වර්තමානයේ තලහගම නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තලහගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ අ.ග.පි. 86 හි කැබලි අංක 343 වූ ප්‍රමාණයෙන් රූඩ් : 01 පර්චස් : 20 ක් ඇතැයි ගණන් බලා තිබෙන තලහගම මූකලාන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :-

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. පි. 86 හි 342 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 86 හි අංක 342, 365 1/2 කැබැල්ල, |
| *දකුණට* | : අ. ග. පි. 86 හි අංක 366, 365 2/2 කැබලි, |
| *බස්නාහිරට* | : අ. ග. පි. 86 හි 340 කැබැල්ල |

නිරෝෂා එස්. ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2024 පෙබරවාරි මස 13 වැනි දින.

09-139/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/(අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් කුසලක නානායක්කාර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති 1982.03.23 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/2981 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බැරගම්මුල්ල, කඹුරුපිටිය පදිංචි ගාර්දිය මුල්ලගේ සිංඤෝ අප්පු වෙත ප්‍රදානය කොට මාතර, ඉඩම් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 111 යටතේ 1986.01.03 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.18** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාරන්දෙණිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බැරගම්මුල්ල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ස. ජ. භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 2 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 64 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 25 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : බුහරේ කුට්ටිය.

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. පි. 56 හි 58 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 56 හි 63 කැබැල්ල, |
| *දකුණට* | : අ. ග. පි. 56 හි 65 කැබැල්ල, |
| *බස්නාහිරට* | : අ. ග. පි. 56 හි 1 පේ කැබැල්ල. |

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2023 දෙසැම්බර් මස 31 වැනි දින.

09-139/3

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) වර්ණකුලසූරිය පටබැඳිගේ ශානිකා ඉරෝෂනී පෙරේරා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.07.15 දින ප්‍රදානය කර ඇති අංක මාර/6/ප්‍ර 34406 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු හොරගල බටහිර පදිංචි වෙල්ලප්පුලිගේ සයිමන් වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 583 යටතේ 1997.03.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.18** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ වරල්ල (දැනට හොරගල බටහිර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වරල්ල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 16 දරන කට්ටි කැඩීමේ පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර 02, රූඩ් 00, පර්චස් 00 ක් විශාලත්වයෙන් ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම -

| | |
|---|---|
| *උතුරට* | : ඩබ්. ජේම්ස් අප්පු ගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : එච්. ජී. සුවාරිස් ගේ ඉඩම, |
| *දකුණට* | : එච්. එල්. අන්දිරිස් ගේ ඉඩම, |
| *බස්නාහිරට* | : ජේ. මාටින් ගේ ඉඩම. |

ඩබ්. පී. ශානිකා අයි. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2023 අගෝස්තු මස 22 වැනි දින.

09-139/4

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කේ. ජී. ඩී. අනෝජා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1998.12.18 දින ප්‍රදානය කර ඇති අංක මාර/4/ප්‍ර/40224 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කෝට්ටෙගෙ දර, නාවලගොඩ, මලිදූව, අකුරැස්ස පදිංචි රණසිං හේවගේ එච්ජින් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 1084 යටතේ 2001.12.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/අනුප්‍රාප්තිකයෙකුවීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.18** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ, උතුර වැලිකැටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නාවලගොඩ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් අක්කර 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩමඃ දොලමුල්ලගුලන

| | |
|---|---|
| *උතුරට* | : දොල රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : දොල රක්ෂිතය, |
| *දකුණට* | : ආර්. එච්. පේමරත්නගේ ඉඩම, |
| *බස්නාහිරට* | : ආර්. එච්. පේමවතීගේ ඉඩම. |

කේ. ජී. ඩී. අනෝජා,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2023 නොවැම්බර් මස 14 වැනි දින.

09-139/5

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ, පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කේ. ටී. සාරංගී ධීරරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1995.03.14 දින ප්‍රදානය කර ඇති කලු/ප්‍ර/අග/443 අංක දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ආර්. ඒ. ඩී. සෝමවතී වෙත මුල් අයිතිය ප්‍රධාන කොට මතුගම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල් ඩී ඕ 45/142 යටතේ 1999.07.30 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.18** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ, පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු මහපත්තුවේ 839 C දිග්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දිග්ගොඩ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කළුතර සර්වේ ජනරාල් භාරයේ ඇති අංක අ.ග.පි. 123 දරන රේඛා සටහනේ අංක 765 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් රූඩ් - 03, පර්. 23 - ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - පොල්වත්තෙමානානෙදෙනිය

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. සි. 123 කැ. අං. 762 (ප්‍රවේශ මාර්ගය) 763, |
| *නැගෙනහිරට* | : අ. ග. සි. 123 කැ. අං. 763, 764, |
| *දකුණට* | : අ. ග. සි. 123 කැ. අං. 104, 107, |
| *බස්නාහිරට* | : අ. ග. සි. 123 කැ. අං. 766 (ප්‍රවේශ මාර්ගය) |

කේ. ටී. සාරංගි ධීරරත්න,
ප්‍රාදේශීය ලේකම්,
පාලින්දනුවර.

2023 දෙසැම්බර් මස 31 වැනි දින.

09-140

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කේ. ජී. ඩී. අනෝජා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1995.12.22 දින ප්‍රදානය කර ඇති අංක මාර/4/ප්‍ර/28686 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අකුරැස්ස, හේනෙගම, පවන ලිපිනයේ පදිංචි යසවතී අනුලා ගුණරත්න ඒකනායක වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 4401 යටතේ 1996.09.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.18** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ, නිමලව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නිමලව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අක්කර 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ඉදිගස්හේන

| | |
|---|---|
| *උතුරට* | : වෙන් කරන ලද පාර, |
| *නැගෙනහිරට* | : වෙන් කරන ලද පාර, |
| *දකුණට* | : 371/GG/199, ඒ. ඩී. දිනෝරිස්ගේ ඉඩම, |
| *බස්නාහිරට* | : LL371/GG/175, සිරිල් කොඩිතුවක්කුගේ ඉඩම |

කේ. ජී. ඩී. අනෝජා,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2023 ඔක්තෝබර් මස 03 වැනි දින.

09-141

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාත් සභාවේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එච්. එස්. කේ. ජේ. බණ්ඩාර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1982.02.19 දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/2566 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන සිරිසඟබෝ පෙදෙස බැදිවැව පදිංචි විජේසිංහ ආරච්චිලාගේ ගුණසිංහ වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 21/2618 යටතේ 1982.03.08 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.11** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

පොලොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, 155 ඒ සිරිසඟබෝ පෙදෙස ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බැදිවැව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. පි. පො. 103 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක ජී 17/59, 22/23 දරන පිඹුරේ අංක 62 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 02 පර්චස් 2.5 ක් විශාලත්වයක් ඇත්තාවූද, බැදිවැව යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : 35, |
| *නැගෙනහිරට* | : 64, |
| *දකුණට* | : 63, |
| *බස්නාහිරට* | : 29 |

එච්. එස්. කේ. ජේ. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
තමන්කඩුව.

2024 ජූලි මස 23 වැනි දින.

09-168

---

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/72067.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NWP/PLC/L9/NK/LTL/37.

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 287 දණ්ඩුවාව ග්‍රාම නිලධාරී වසමේ, බුදුමුත්තාව ගමේ කැ. සි. අ. 420044 හි කැබලි අංක 3:63 ප්‍රමාණයෙන් හෙක්: 1.6541 ක් වූ රජයේ ඉඩම් කොටස ආගමික කටයුතු සඳහා දණ්ඩුවාව ආරණ්‍ය සේනාසනයේ දායක සභාව විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | 38, 64, |
| *නැගෙනහිරට* | : | 64, 62, |
| *දකුණට* | : | 62, |
| *බටහිරට* | : | 38 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2023.12.11 දින සිට වසර 30 ක් ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

වාර මුදල : අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම ආරණ්‍ය සේනාසනය පවත්වාගෙන යාම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* (I) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුලත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි සේනාසනය සඳහා අවශ්‍ය සියලුම කටයුතු කළ යුතුය.

(II) බදු ගන්නන් විසින් මෙකී ඉඩමෙහි, පිහිටි ගස්කොළන් ආදිය සම්පූර්ණයෙන්ම ආරක්ෂා කළ යුතුය. කිසියම් හේතුවක් නිසාවත් ප්‍රාදේශීය ලේකම්ගේ ලිඛිත අවසරයක් නොලබා මෙම ගස්කොළන් කපා හෙළීම, විනාශ කිරීම හෝ හානි කිරීම නොකළ යුතුය.

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.12.11 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම බදු ගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 02 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-152

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/64499.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : එන්පී/28/04/02/01/951

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

වව්නියාව දිස්ත්‍රික්කයේ, වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ට්‍රැක් 07 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ට්‍රැක් 07 ගමේ ප්‍රමාණයෙන් අක්කර 05 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු (කජු වගාව) සඳහා දොන් ජුවාන් ධර්මරත්න රාල්ලාගේ සුමිත්ත පැරකුම් මහේන්ද්‍ර කරුණාරත්න මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | රජයේ ඉඩම, |
| *දකුණට* | : | රජයේ ඉඩම, |
| *බටහිරට* | : | රජයේ ඉඩම, |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (ගරු ඇමතිතුමා අනුමත කළ දින සිට ඉදිරියට වසර තිහක්) (2022.10.05)

(ආ) *වාර්ෂික බදු මුදල.*- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර්ෂික බදු මුදලක් නැත.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2022.10.05 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 අගෝස්තු මස 27 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-161

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : LTL/45/1560

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 165 තොන්ඩමාන්නගර් ග්‍රාම නිලධාරී වසමේ තොන්ඩමාන්නගර් ගමේ කැ. සි. 920010, කලාප 03 පිඹුරේ කැබලි අංක 89 දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0797 වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ගනේෂපුල්ලේ මනෝහරන් මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 72, |
| *නැගෙනහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 2 සහ 90, |
| *දකුණට* | : | මෙම පිඹුරේ කැබලි අංක 90 සහ 88, |
| *බටහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 88. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2024.08.07 සිට 2054.08.06 දක්වා)

(ආ) *වාර්ෂික බදු මුදල.*- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ රුපියල් මිලියන පහට (5,000,000) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදල අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුතු සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2024.08.07 සිට අවුරුදු 05 ක් ගත වන තුරු මෙම ඉඩම බදු ගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. ජී. පී. සෞම්‍යා
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 අගෝස්තු මස 30 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-165

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/70857.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : UPLC/L/01/WM/L/59.

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 62 ඊ හීන්නාරංගොල්ල ග්‍රාම නිලධාරී වසමේ හීන්නාරංගොල්ල ගමේ අ.ග. පි. 190 හි කැබලි අංක 311 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 5.410 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා සී/ස කොලිටි සීඩ් පුද්ගලික සමාගම විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 87 හා 84, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 84, 83, 96, 239 හා 93, |
| *දකුණට* | : | කැබලි අංක 83, 96, 239, 93, 91 හා 89, |
| *බටහිරට* | : | කැබලි අංක 87 හා 87 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2023.03.31 දින සිට වසර 30 ක් ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල.*- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ රුපියල් මිලියන පහට (5,000,000) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුතු සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස් (ඌව/ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාල ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2023.03.31 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*(ඒ)* බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 අගෝස්තු මස 30 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-166

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/74281.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : UPLC/L/26/KG/L/275.

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 146බී දෙටගමුව ග්‍රාම නිලධාරී වසමේ, කොච්චිපතාන ගමෙහි පිහිටි බලයලත් මානක ඩී. එම්. ඩබ්. බී. දිසානායක මහතා විසින් මැන සකස් කරන ලද අංක 2019/1567 දරන අනුරේඛනයේ කැබලි අංක A මගින් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 02 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා රවීන්ද්‍ර පතිරත්න මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය, |
| *නැගෙනහිරට* | : | රුවන් චාමර භුක්ති විඳින ඉඩම, |
| *දකුණට* | : | චන්ද්‍රසේනගේ ඉඩම, |
| *බටහිරට* | : | මාර්ගය, |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2024.05.28 - 2054.05.27 දක්වා)

*වාර්ෂික බදු මුදල*.- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපල වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහක (රු. 5,000,000) ට වැඩි වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතු ය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2024.05.28 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 02 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-167

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.